# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධීවර සහ ජලජ සම්පත්
## (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා විසින්
2016 ජනවාරි මස 26 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජනවාරි මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[61 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009679— 425 (2016/01)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 49 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත වරදවල් සිදු කරන ලද තැනැත්තන් සම්බන්ධයෙන් වැඩි දඩ මුදල් පැනවීමය.

*3 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත වරදවල් සිදු කරන තැනැත්තන් සම්බන්ධයෙන් මේ පනත යටතේ පනවනු ලැබිය හැකි උපරිම දඩ මුදලෙන් තුනෙන් එකක් නොඉක්මවනු ලබන මූල්‍යමය දණ්ඩනයක් පනවනු ලැබීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත බලය දීමය.

*4 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මසුන් හා ධීවර නිෂ්පාදන අපනයනය හා ආනයනය කිරීම විධිමත් කිරීම ය.

ධීවර සහ ජලජ සම්පත්
(සංශෝධන)

එල්.ඩී.– ඕ. 46/2015.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක      දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1996 අංක 2 දරන පනතේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "14ඉ, 15, 16, 17 හෝ 22 වන වගන්තිවල" යන වචන හා ඉලක්කම් වෙනුවට "15, 16, 17 හෝ 22 වන වගන්තිවල" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(1අ) මේ පනතේ 14ඉ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම උල්ලංඝනය කරන හෝ පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය."

(3) (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :–

"(7) මේ පනතේ 61 (1) (ත) වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත උල්ලංඝනය කළ යම් තැනැත්තෙක්

2– PL 009623-425 (2015/12)

වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ මෙහි උපලේඛනයේ I වන තීරයේ සඳහන් සටහනෙහි නිශ්චිතව දැක්වෙන ධීවර බෝට්ටුවේ දිග මත පදනම්ව මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දැක්වෙන දඩ මුදල හෝ අල්ලාගත් මසුන් ප්‍රමාණයේ වටිනාකම මෙන් පස් ගුණයකට වඩා අඩු නොවන දඩ මුදලක් යන මුදල් දෙකෙන් වඩා වැඩි මුදලට අඩු නොවන දඩයකට එම තැනැත්තා යටත් විය යුතු ය.

උපලේඛනය

| I *වන තීරය* | II *වන තීරය* |
|---|---|
| ධීවර බෝට්ටුවේ දිග | දඩ මුදල |
| මීටර් 10.3ට වැඩි සහ මීටර් 15ට වඩා අඩු | රුපියල් මිලියන 1.0 |
| මීටර් 15ට වැඩි සහ මීටර් 24.0ට අඩු | රුපියල් මිලියන 1.5 |
| මීටර් 24.0ට වඩා වැඩි සහ මීටර් 45.0ට වඩා අඩු | රුපියල් මිලියන 15 |
| මීටර් 45.0ට වඩා වැඩි සහ මීටර් 75.0ට වඩා අඩු | රුපියල් මිලියන 25 |
| මීටර් 75.0ට වඩා වැඩි | රුපියල් මිලියන 50 |

(8) මේ පනතේ 61 (1) (ද) වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් අදළ අල්ලා ගත් මසුන් ප්‍රමාණයේ වටිනාකම මෙන් පස් ගුණයකට වඩා අඩු නොවන දඩයකට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "අදාළ අල්ලාගත් මසුන් ප්‍රමාණය" යන්නෙන් මේ පනතේ 52ඉ වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජික මණ්ඩලයක් විසින් තක්සේරු කරනු ලබන වරද සිදු කළ අවස්ථාවේ දී අල්ලා ඇති මසුන් ප්‍රමාණය අදහස් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 52ආ, 52ඇ, 52ඈ, සහ 52ඉ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52ආ, 52ඇ, 52ඈ සහ 52ඉ යන වගන්ති ඇතුළත් කිරීම.

"දණ්ඩනයක් පැනවීම.

52ආ. (1) බලපත්‍රලාභියකු වන යම් තැනැත්තකු මේ පනතේ 14අ, 14ඉ, 14ඊ හෝ 14උ යන වගන්තිවල විධිවිධාන හෝ මේ පනතේ 61(1)(ත) හෝ 61(1)(ද) වගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් ක්‍රියාකර ඇති බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂ - ජනරාල්වරයාට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක දී අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් මේ පනතේ 52ඉ වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ නිර්දේශ මත සහ පළමු වරට වරදකරුවකු වන වරදකරුවකු සම්බන්ධයෙන් වන විට, ඒ වරද කිරීමට අදාළ පරිවේෂණ සැළකිල්ලට ගෙන සහ දණ්ඩනයක් පැනවීම උචිත වන අවස්ථාවක දී එම තැනැත්තා වෙත නියමිත ආකෘතිය අනුව වූ දැන්වීමක් භාර දීමට කටයුතු සැලැස්විය යුතු අතර, එම දැන්වීම ලැබුණු දින සිට මාසයක් ඇතුළත තමා ඉදිරියේ පෙනී සිට එම දණ්ඩනයට ඔහු යටත් නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) එම දැන්වීම ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත එම දැන්වීම භාරදෙනු ලැබූ තැනැත්තා විසින් මේ පනතේ 14අ, 14ඉ, 14ඊ, හෝ 14උ වන වගන්තිවල විධිවිධාන හෝ මේ පනතේ 61(1)(ත) හෝ 61(1)(ද) වගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් ක්‍රියාකර ඇති බව පිළිගනු ලබන විට එම තැනැත්තා අධිකරණය විසින් වරදකරු කරනු ලැබුවහොත් එම තැනැත්තා වෙත මේ පනත යටතේ පනවනු ලැබිය හැකි උපරිම දඩ මුදලින් තුනෙන් එකක් නොඉක්මවන මුල්‍යමය දණ්ඩනයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එම තැනැත්තා වෙත පනවනු ලැබිය යුතු ය.

(3) (අ) දැන්වීම් භාරදෙනු ලැබූ තැනැත්තා එසේ දැන්වීම ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත ඉදිරිපත්ව දණ්ඩනය පැනවීමට එරෙහිව දැක්විය හැකි හේතු තමා සතු බව සඳහන් කරන අවස්ථාවක දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියම කර ඇති ආකාරයට එම කරුණ අසා තීරණය කිරීමට වහාම ක්‍රියා කළ යුතු ය.

(ආ) ඉදිරිපත් කර ඇති හේතු පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමකට පත් නොවන අවස්ථාවක දී ඔහු විසින් ඒ සඳහා හේතු දක්වා මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන දණ්ඩනය පනවනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ 14අ, 14ඉ, 14ඊ හෝ 14උ වන වගන්තිවල විධිවිධාන හෝ මේ පනතේ 61(1)(ත) හෝ 61(1)(ද) වගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට මුල්‍යමය දණ්ඩනයක් පනවනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා වෙත නියමිත ආකෘතිය අනුව වූ දැන්වීමක් භාරදීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා කටයුතු සැළැස්විය යුතු ය.

(5) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙක් (3) වන උපවගන්තිය යටතේ කරන ලද එම තීරණය ලැබුණු දින සිට දින තිහක් ඇතුළත (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(6) ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණය සහ ඒ වරද කිරීමට අදළ පරිවේෂණ

සැළකිල්ලට ගෙන එවැනි යම් අභියාචනයක් පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු අතර–

(අ) අභියාචනයකට අවසර දීම, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සහ ඒ අනුව ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට විධාන කිරීම ; හෝ.

(ආ) හේතු දැක්වීමක් සහිතව අභියාචනයට අවසර නොදීම යන,

දෙයාකාරයෙන් එක් ආකාරයකට කටයුතු කරනු ලැබිය හැකි ය.

(7) ලේකම්වරයා විසින් විධානය නිකුත් කරන ලද දින සිට දින දහතරක් ඇතුළත අධ්‍යක්ෂ-ජනරල්වරයා විසින් එම විධානයට අනුකූලව කටයුතු කළ යුතු අතර, ඔහුගේ තීරණයෙන් අතෘප්තියට පත් තැනැත්තා වෙත ලේකම්වරයාගේ විධානය දැනුම් දිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් එවැනි දැන්වීමක් යවනු ලැබුවහොත් හෝ එම තැනැත්තා පදිංචිව සිටි බවට අවසන්වරට දැන සිටි ස්ථානයේ දී එම දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබුවහොත් එම දැන්වීම එම තැනැත්තා වෙත භාර දී ඇති සළකනු ලැබිය යුතු ය.

(9) මේ පනතේ අන්තර්ගතව කුමක් සඳහන් වුව ද අදාළ චූදිතයා එම වරද සිදු කිරීම පිළිගනු ලබන විට සහ එම දණ්ඩන මුදල ගෙවා ඇති විට එම වරද සම්බන්ධයෙන් කිසිදු අධිකරණයක යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අභියාචනය කිරීමේ අයිතිය.

52ඈ. ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත්වන යම් තැනැත්තකුට එම තීරණය දැනුම් දෙන ලද දින සිට දින තිහක් ඇතුළත නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

පූර්ව නිගමනය.

52ඉ. ධීවර කටයුතුවල නියැලී සිටින යම් තැනැත්තෙක් ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය සමග සම්බන්ධවීම පැහැර හරින හෝ පැයක කාලයක් සඳහා ධීවර මෙහෙයුම් කටයුතු අතරතුර යාත්‍රා අධීක්ෂණය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම පැහැර හරින අවස්ථාවක දී පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තුරු එම තැනැත්තා මේ පනතේ 14අ, 14ඉ, 14ඊ හෝ 14උ යන වගන්තිවල විධිවිධාන හෝ මේ පනතේ 61(1)(ත) හෝ 61(1)(ද) වගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කර ඇති බවට උපකල්පනය කරනු ලැබේ.

විශේෂඥ මණ්ඩලයක් පත් කිරීම.

52ඊ. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, නීතිය සහ ගණකාධිකරණය යන ක්ෂේත්‍රයන්හි දැනුම හා පළපුරුද්ද ඇති තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) එම විශේෂඥ මණ්ඩලයේ කර්තව්‍ය විය යුත්තේ යම් තැනැත්තකු වෙත මූල්‍යමය දණ්ඩනයක් පැනවිය යුත්තේ කවර පරිවේෂණයන් යටතේ ද යන්න පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත නිර්දේශ ලබා දීම ය.

(3) අමාත්‍යවරයා විසින් එම මණ්ඩලයේ සාමාජිකයන් වෙත මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා ඔහු විසින් තීරණය කරනු ලබන යම් මූල්‍යමය පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ඍඑ) ඡේදයේ සඳහන් "ගම් මට්ටමින් ධීවර සංවිධාන පිහිටුවීම; සහ" යන වචන වෙනුවට "ගම් මට්ටමින් ධීවර සංවිධාන පිහිටුවීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ත) ඡේදයේ (iv) වන අයිතමයේ "කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීම.". යන වචන වෙනුවට "කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීම; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ද) මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය හා ආනයනය කිරීම විධිමත් කිරීම.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.